# විදුලිබල ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙනයාම

## බලශක්ති ක්ෂේත්‍රයේ රාජ්‍ය ව්‍යවසාය සඳහා වන උපායමාර්ගික ප්‍රතිසංස්කරණ පිළිබඳ ඇගයීම

වාර්තාව සකස් කළේ: රොහාන් සමරජීව සහ පුන්සරා නාගසිංහ

2026 පෙබරවාරි

## මූලික සාරාංශය

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය ප්‍රතිසංස්කරණය කිරීමේ උත්සාහයන් 1990 දශකයේ අගභාගයේ සිට ක්‍රියාත්මක විය. එහෙත්, ඒ සම්බන්ධයෙන් අත්කරගෙන ඇත්තේ ඉතා අඩු ප්‍රගතියකි. ආර්ථික අර්බුදයෙන් පසුව, කර්මාන්තයට බලපාන විකෘතිතා ඉවත් කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම උදෙසා පුළුල් ප්‍රතිසංස්කරණයක් අත්‍යවශ්‍ය බව පෙනී ගියේය. ප්‍රතිසංස්කරණවල අත්‍යවශ්‍ය බව පිළිබඳ පොදු එකඟතාවක් පැවතියද, එම ප්‍රතිසංස්කරණවල ස්වභාවය පිළිබඳව එකඟතාවක් නොමැත. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ක්‍රියාත්මක කිරීමත්, අදියර දෙකකින් යුත් වෙන් කිරීමේ (unbundling) ක්‍රියාවලියක් හඳුන්වා දෙමින් ඊට පසුව සිදු කළ සංශෝධනයත් සමඟ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ඉදිරියට ගොස් ඇත.

මෙම වාර්තාව 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සිදු කරන ලද වෙනස්කම් ආරම්භක ලක්ෂ්‍යය ලෙස සලකයි. අනුවර්තනය කරන ලද මැදිහත්වීමේ ක්‍රමවේදයක් මත පදනම්ව, අවිනිශ්චිතතාව අවම කිරීම, සංක්‍රාන්ති අවදානම් කළමනාකරණය කිරීම, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ වේගය පවත්වා ගැනීම සහ වර්තමාන අක්‍රියතා මගහරවා ගනිමින් ආර්ථික වර්ධනයට අවස්ථාව ලබාදෙන විදුලිබල කර්මාන්තයක් බිහි කිරීම යන සමස්ත අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉවහල් වන ප්‍රායෝගික ක්‍රියාමාර්ග මෙමගින් හඳුනා ගැනේ. මෙම ක්‍රියාවලියට බලපාන බාධා අවම කර ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කර්මාන්තයේ පවතින අක්‍රියතා සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ආයෝජන සක්‍රිය කිරීමේ කේන්ද්‍රීය වැදගත්කම සහ හදිසිභාවය මෙන්ම, ආර්ථික වර්ධනයට අත්‍යවශ්‍ය වන සැපයුම සහ ගුණාත්මකභාවය සඳහා අවශ්‍ය කොන්දේසි නිර්මාණය කිරීම පදනම් කරගෙන, පහත දැක්වෙන ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත:

- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ආකෘතිය පැහැදිලි කිරීම ඇතුළුව, 100%ක් රජය සතු ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සම්පාදක (NTNSP) හැර වෙනත් පාර්ශව වෙත අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ලබාදීම සඳහා වන විධිවිධාන හරහා සම්ප්‍රේෂණ ශක්‍යතාව (capacity) පුළුල් කිරීම;
- විදුලිය බෙදාහැරීම සහ සැපයුම වෙන් කිරීම මගින් සහ අවසන් පැවරුම් සැලැස්ම මගින් පිහිටුවනු ලබන බෙදාහැරීමේ සමාගම්වල පෞද්ගලික ආයෝජන සඳහා වන අවස්ථා පැහැදිලි කිරීම ඔස්සේ බෙදාහැරීමේ ක්ෂේත්‍රයේ අවස්ථා විවෘත කිරීම;
- විශ්‍රාම අරමුදල් මගින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ක්‍රමවේද අධ්‍යයනය කිරීම; සහ
- පහත හෙළන ලද හරස් හිමිකාරීත්ව සීමාවන් හේතුවෙන් ආයෝජනයට ඇති වන යම් බාධාවක් වේ නම්, ඒවා විසඳීම සඳහා සුදුසු ප්‍රතිපත්තිමය සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් පනවා ඇති සීමාවන් තුළ, රජයේ ඇපකර සහිත ණය ලබා ගැනීමේ අවශ්‍යතාව විසඳීම සඳහා වන ක්‍රියාමාර්ග මෙහි යෝජනා කර ඇත. අවසන් පැවරුම් සැලැස්ම යටතේ බෙදාහැරීමේ සමාගම්වල බල ප්‍රදේශ නිර්ණය කිරීම, නිර්ණායක පදනම් කරගත් නියාමනයට (benchmark regulation) හිතකර විය යුතු බව යෝජනා කෙරේ. යෝජිත

අනුබද්ධ සේවා වෙළඳපොළ (ancillary services markets) හැකි ඉක්මනින් ස්ථාපිත කිරීමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය කර ඇත.

පනතේ 3 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද කාරක සභාව සඳහා අවශ්‍ය සම්පත් ලබා දිය යුතු බවත්, ප්‍රධාන ජලවිදුලි බලාගාර හැර ලංකා විදුලිබල මණ්ඩලය සතු අනෙකුත් බලාගාරවල ආයෝජන අවශ්‍යතා ඇතුළත් ලේඛනයක් සකස් කළ යුතු බවත් යෝජනා කෙරේ. පාරිභෝගිකයාම නිෂ්පාදකයා වීමේ ආකෘතියක් (prosumer model) වෙත ක්‍රමයෙන් මාරුවීම සහ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම වැදගත් වේ. එසේම, පවතින නමුත් දැනට ක්‍රියාත්මක නොවන සහනාධාර පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමද වැදගත් වේ.

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සිදු කිරීමට යෝජනා කෙරේ:

- "ආරක්ෂාව පිළිබඳ සීමාවන්ට යටත් වූ ආර්ථික මුදාහැරීම" (security constrained economic dispatch) නම් නිර්ණායකය;
- අවසන් පැවරුම් සැලැස්ම යටතේ පිහිටුවනු ලබන සමාගම් සඳහා රජය නියෝජනය කරන අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ පටිපාටිය; සහ
- අවසන් පැවරුම් සැලැස්ම තුළ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සම්පාදක (NTNSP) සතුව පවතින LTL කොටස් වැනි සම්ප්‍රේෂණ නොවන වත්කම්වල තත්ත්වය.